

**ඩීටර් එෆ්. උක්ඩෝෆ්**
**සභාපතිතුමා විසිනි**
*පළවෙනි සභාපතිත්වයේ දෙවෙනි උපදේශකවරයා*

# ප්‍රීතිමත් පවුලක් සඳහා එක් යතුරක්

ශ්‍රේෂ්ඨ රුසියානු ගත් කතුවරයෙක්වන ලියෝ ටෝල්ස්ටෝයි ඇනා කැතරිනා නම් සිය නවකථාව ආරම්භ කළේ මෙම වචනවලිනිඃ “ප්‍රීතිමත් පවුල් සෑම එකක්ම එකාකාරය; අසතුටෙන් සිටින සෑම පවුලක්ම ඔවුන්ගේම කරදර නිසා අසතුටෙන් සිටිති.”[1] ප්‍රීතිමත් පවුල් සෑම එකක්ම එකාකාරය යන ටෝල්ස්ටෝයිගේ ස්ථිරත්වය මට නොතිබුනද, බොහෝ දෙනෙකුට ඇති එක් පොදු දෙයක් නම් මා සොයාගෙන ඇතඃ අන් අයගේ අඩුපාඩු වලට කමාවදී අමතකකර, යහපත දෙස බැලීමේ සිරිතක් ඔවුන්ට ඇත.

අසතුටෙන් සිටින පවුල්වල අය, වෙනත් ආකාරයකට, නිතරම වැරදි සොයන, අමනාපයෙන් සිටින අය, අතීත වැරදි අමතක කරන බවක්ද පෙනෙන්ට නැත.

“ඔව්, නමුත් . . .” අසතුටෙන් සිටින අය එසේ පටන් ගනිති, “ඔව්, නමුත් ඇය කොතරම් නරක අන්දමට මගේ සිත රිදෙව්වාදැයි ඔබ දන්නේ නැහැ” යමෙක් කියයි, “ඔව්, නමුත් ඔහු කොපමණ දරුනු දැයි ඔබ දන්නේ නැහැ,” තවත් කෙනෙක් එසේ කියයි.

සමහරවිට දෙදෙනාම නිවැරදිය, සමහරවිට නැත.

වැරදිවල බොහෝ මට්ටම් ඇත. සිත්රිදීම්වල බොහෝ මට්ටම් ඇත. නමුත් මා දැක තිබෙන දෙයක් වන්නේ, අපගේ කෝපය අපි සාධාරණයකර අපගේ හෘදසාක්ෂිය තෘප්තිමත්කිරීමට අන් අයගේ චේතනා ගැන කථාන්තර අපටම කීමය. එමගින් ඔවුන්ගේ ක්‍රියා කමාවදිය නොහැකි, ආත්මාර්ථකාමී පහත් දේවල් ලෙස සලකා, අපගේ චේතනා පිරිසිදු අහිංසක ඒවා ලෙස උසස්කිරීමය.

## රාජකුමාරයාගේ සුනඛයා

13 වෙනි ශතවර්ෂයේ වේල්සයේ පරණ කථාවකට අනුව රාජ කුමාරයෙකු නිවසට පැමිණෙන විට ඔහුගේ සුනඛයාගේ මුහුණින් ලේ වැගිරෙමින් තිබෙනු ඔහු දුටුවේය. විගසින් ගෙට අතුල්වූ ඔහු භීතියට පත්වූයේ ඔහුගේ බිළිඳු පුතා නැතිවී, තොටිල්ලද පෙරළාදමා තිබූ නිසාය. කෝපයට පත් කුමාරයා ඔහුගේ අසිපත ඇද, ඔහුගේ සුනඛයා මරා දැමීය. ඉන්පසුව, මඳ වේලාවකින්, ඔහුගේ පුතා හඬනු ඔහුට ඇසින—බිළිඳා ජීවත්ව සිටී! බිළිඳාගේ පසෙකින් මියගිය වෘකයෙක් වැතිර සිටියි. සත්‍යලෙසම, සුනඛයා මිනීමරු වෘකයාගෙන් කුමාරයාගේ බිළිඳා ආරක්ෂකර තිබින.

මෙම කථාව නාට්‍යාකාර වුවත්, එයින් එක් කරුණක් ප්‍රදර්ශනයවෙයි. අන් අයගේ යම් හැසිරීම් ගැන අප අපටම කියන කථා නිතරම සත්‍ය නොවීමට හැකියාවක් ඇතිකරයි—සමහර අවස්ථාවලදී සත්‍යය දැනගැනීමට පවා අපට අවශ්‍යතාවයක් නැත. ඒ වෙනුවට අප අපගේ තිත්තකම සහ අමනාපය තබාගැනීම මගින් අපගේ කෝපය ස්වයංව සාධාරණයකරගනියි. සමහර අවස්ථාවලදී මෙම කෝන්තර මාස ගණන් හෝ වසර ගණන් පැවතිය හැක. සමහර අවස්ථාවලදී ඒවා ජීවිත කාලයේම පවතිනු ඇත.

### බෙදීගිය පවුලක්

තමා ඉගැන්වූ මාවතෙන් සිය පුත්‍රයා පිටයාම නිසා ඔහුට කමාව දීමට එක් පියෙකුට නොහැකිවිය. පිරිමි ළමයාට සිටි මිතුරන් පියා අනුමත නොකළ අතර, ඔහු කළ යුතු යයි පියා සිතූ දේවලට විරුද්ධ බොහෝ දේවල් ඔහු කළේය. මෙයින් පියා සහ පුතා අතර භේදයක් ඇතිවිය. පිරිමි ළමයා තමාට හැකිවූ විගස නිවසින් පිටවගිය අතර, නැවත නොආවේය. ඔවුන් නැවත කථා කළේ කලාතුරකිනි.

පියාට යුක්තිසහගත බවක් හැඟුනේද? සමහරවිට.

පුතාට යුක්තිසහගත බවක් හැඟුනේද? සමහරවිට.

මා දන්නා පරිදි මෙම පවුලට වෙන්වීමට සහ අසතුටුවීමට සිදුවුනේ, පියාට හෝ පුතාට එකිනෙකාට කමාවදීමට නොහැකිවූ නිසාය. ඔවුන් එකිනෙකාට අතීතයේ තිබූ තිත්ත මතකයන් ගැන බැලීමට නොහැකිවිය. ඔවුහු සිය හදවත් ප්‍රේමය සහ කමාව වෙනුවට කෝපයෙන් පුරවාගත්හ. හැම කෙනෙක්ම අනෙකාගේ ජීවිතය යහපතට පෙළඹවීමේ අවස්ථාව සොරාගත්හ. ඔවුන් අතර බෙදීම විශාල ගැඹුරින් සහ පළලින් පෙනුන අතර, හැම කෙනෙක්ම තමන්ගේම චෛතසික දූපතේ ආත්මික සිරකරුවෙක් බවට පත්විය.

වාසනාවකට මෙන්, අපගේ ස්වර්ගයේ වැඩසිටින ප්‍රේමනීය ඥානවන්ත සදාකාලික පියාණන්වහන්සේ මෙම මාන්නාධික හිදැස ජයගැනීමට උපක්‍රමයක් ලබාදී ඇතිසේක. ශ්‍රේෂ්ඨ සහ අසීමිත වන්දිගෙවීම කමාවේ සහ සමාදානයේ උත්තරීතර ක්‍රියාවවේ. එහි මහත්බව මගේ අවබෝධය අභිබවා යයි, නමුත් එහි සත්‍යතාව සහ අත්‍යන්ත බලය ගැන මම මගේ මුළු හදවතින් සහ ආත්මයෙන්ම සාක්ෂිදරමි. අපගේ පව් වෙනුවෙන් ගැලවුම්කරුවාණෝ තමන්වහන්සේව වන්දියක් ලෙස පිරිනැමූසේක. උන්වහන්සේ තුලින් අපට කමාව ලැබෙන්නේය.

### අංගසම්පූර්ණ කිසි පවුලක් නැත

අප කිසිවෙක් පාප රහිත නැත. අපි සැම කෙනෙක්ම, ඔබ සහ මාද ඇතුළුව, වැරදි කරන්නෙමු. අප සියල්ලෝ තුවාල ලබා ඇත. අප සියල්ලෝ අන් අය තුවාලකර ඇත.

අපට උත්කර්ෂය සහ සදාකාලික ජීවනය ලබාගත හැක්කේ ගැලවුම්කරුවාණන්ගේ වන්දිගෙවීම තුලින්ය. අපි උන්වහන්සේගේ මාර්ග පිළිගෙන සහ අපගේ හදවත් මෘදුකිරීම මගින් අපගේ අහංකාරකම මැඩපවත්වන විට, අපගේ පවුල්වලට සහ අපගේ පුද්ගලික ජීවිතවලට ප්‍රතිසංධානය සහ කමාව ගෙන ඒමට අපට හැකිය. වැඩියෙන් කමාවදීමට, දෙවරක් දීමට කැමැත්ත ඇතිවීමට, අපගෙන් වැරැද්දක් නොවූ යමකට වුවද පළමුව කමාව ඉල්ලීමට, පැරණි කෝන්තර පසෙක තබා ඒවා පෝෂණය නොකිරීමට දෙවියන්වහන්සේ අපට උදව්කරනසේක. සිය ඒකජනක පුත්‍රයාණන් අපට දුන් දෙවියන්වහන්සේටද, අප වෙනුවෙන් ජීවිතය දුන් පුත්‍රයාණන්ටද ස්තුතිවේවා.

දෙවියන්වහන්සේ අපට දක්වන ප්‍රේමය සැමදාම අත්විඳීමට අපට හැකිය. "Because I Have Been Given Much"[2] (මට බොහෝ ලබාදී ඇති නිසා), යන ආදරණීය ගීතිකාවෙන් ඉගැන්වෙන පරිදි, අපගේ සහෝදර ජනතාවට අපගෙන් ටිකක් වැඩිපුර දීමට හැකියාවක් අපට නැතිද? කමාව දීමට දෙවියන්වහන්සේ අපට දොර විවෘතකර ඇතිසේක. අපගේම මමත්වය සහ අහංකාරය පසෙක තබා අප පරිශ්‍රමදරන අයට කමාවේ එම ආශිර්වාදිත දොර විවෘතකිරීම ආරම්භකරන්න—විශේෂයෙන්ම අපගේම පවුලේ සියලුදෙනාටමය.

අවසානයේදී, සතුට පැනනගින්නේ සම්පූර්ණත්වයෙන් නොව, නමුත් දිව්‍යමය මූලධර්ම, කුඩා පියවරින් වුවද, අදාලකිරීමෙනි. පළවෙනි සභාපතිත්වය සහ දොළොස්දෙනාගේ ගණපූර්ණය මෙසේ ප්‍රකාශකර ඇත: "පවුල් ජීවිතයේ සතුට වැඩිවශයෙන් ලබාගත හැක්කේ ස්වාමීන්වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් මත ගොඩනගාගත්විටය. සාර්ථක විවාහ සහ පවුල් ගොඩනගා පවත්වාගනු ලබන්නේ, ඇදහිල්ල, යාච්ඤාව, පසුතැවිල්ල, කමාවදීම ගරුකිරීම, ප්‍රේමය, අනුකම්පාව, වැඩකිරීම, සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් මතය."[3]

කමාවදීම ස්ථාපිතකර ඇත්තේ අපගේ ස්වර්ගික පියාණන්වහන්සේගේ සතුටේ සැලසුම මත ගොඩනගා තිබෙන සරල සත්‍යයන්වල හරි මැදය. කමාවදීම මූලධර්මවලට සම්බන්ධ නිසා, එය ජනතාව සම්බන්ධකරයි. එය යතුරකි, එය දොරවල් විවෘතකර වසාදමයි. එය අවංක මාරගයක ආරම්භයයි, එසේම එය ප්‍රීතිමත් පවුලක් සඳහා අපගේ එක් හොඳම බලාපොරොත්තුවයි.

අපගේ පවුල් තුල මඳක් වැඩියෙන් කමාවදීමටත්, එකිනෙකාට වඩාත් කමාවදීමට සහ සමහරවිට අපටම වැඩියෙන් කමාවදීමට පවා දෙවියන්වහන්සේ අපට උපකාර කරත්වා. බොහෝ ප්‍රීතිමත් පවුල් එකාකාරව සමානවන එක් අසිරිමත් මාර්ගයක් ලෙස කමාවදීම අත්විඳීමට අපට හැකිවේවායි මම යාච්ඤාකරමි.

**සටහන්**

1. Leo Tolstoy, *Anna Karenina,* trans. Constance Garnett (2008), 2.
2. "Because I Have Been Given Much," *Hymns,* no. 219.
3. "පවුල: ලෝකයාට ප්‍රකාශනයකි," *Liahona,* නොවැ. 2010, 129; අවධාරණ ඇතුළත්ය.

### මෙම පණිවුඩයෙන් ඉගැන්වීම

“ඔබ එක් එක් පාඩමට සූදානම්වන විට, පවුල් සාමාජිකයන් ඔවුන්ගේ ජීවිතවල අත්විඳ තිබෙන දෙයක් ලෙස මූලධර්මයක් සලකන්නේ කෙසේදැයි ඔබගෙන්ම අසන්න.” *(Teaching, No Greater Call [1999]*, 171). කමාවදීම ගැන පවුල් සාමාජිකයන් සතු හෝ ඔවුන් දැක තිබෙන සුභවාදී අත්-දැකීම් බෙදාගැනීමට ඔවුන්ට ආරාධනාකිරීම ගැන සලකාබලන්න. මෙම අත්-දැකීම් ගැන සාකච්ඡාකර, කමාවදීමේ ආශිර්වාද ගැන අවධාරණයකරන්න. එකිනෙකාට කමාවදීමේ වැදගත්කම ගැන සාක්ෂි දැරීම මගින් අවසන්කරන්න.

## තරුණ අය

### යාච්ඤාව සහ සමාදානය
### ලෝරන් ඩබ්ලිව්. විසිනි

එක් සැන්දෑවක මම මාගේ මව සමග වාදකර බොහෝ කණගාටු වූනෙමි. එනිසා යාච්ඤාකළ යුතු බව මම තීරණය කළෙමි. මා ව්‍යාකූල තත්වයක සිටි නිසා “ආත්මික” වීමට අවශ්‍ය නොවූනද, යාච්ඤාකිරීමෙන් සතුට හැඟීම සහ වාදශීලීත්වය අඩුවන බවද මම දැනසිටියෙමි. මගේ මව කාමරයෙන් පිටවූ පසුව, මම යාච්ඤාකිරීමට පටන්ගත්තෙමි. “ආදර ස්වර්ගික පියාණන්වහන්ස, මා අද රාත්‍රී ඔබවහන්සේ වෙත එන්නේ . . .” නැත. මම ඇස් ඇර මගේ අත් පහත දැමූවෙමි; එහි නුහුරු බවක් හැඟේ. මම නැවතත් උත්සාහ කළෙමි. ස්වර්ගික පියාණන්වහන්ස, මට අවශ්‍ය . . .” එහිද අමුතු හඬක් ඇත. ස්වර්ගික පියාණන්ගෙන් උදව් ඉල්ලන යාච්ඤාව නවත්වන ලෙස සාතන් ඉල්ලන බව මට හැඟින.

හදිසියේම ඔබවහන්සේට ස්තුතියි! කීමට පෙළඹවීමක් මට ලැබිනි. මම එය කළෙමි. ස්වර්ගයේ වැඩසිටින මගේ පියාණන්වහන්සේට මා ස්තුතිවන්ත විය යුතු බොහෝ සිතිවිලි මගේ මනසින් වැගිරීමට පටන්ගත්තේය. මා උන්ව-හන්සේට ස්තුතිකර අවසන්වූ පසුව, මගේ ප්‍රශ්නය ගැන මම සාකච්ඡා කළෙමි.

පසුව මගේ ඇතුලාන්තයේ අසිරිමත් සමාදානයක් මට දැනුනි. එම උණුසුම් ආත්මික හැඟීමෙන්, අපගේ ස්වර්ගික පියාණන් සහ මගේ දෙමාපියෝ මට මට ප්‍රේමකරන බවත් මා දේව දරුවෙක් බවත් මම දැනගත්තෙමි. මගේ මවගෙන් කමාව ඉල්ලීමට සහ ඇගේ කමාව පිළිගැනීමට මට හැකිවිය.

## ළමයි

### කමාවදීමන් සතුට ලැබේ.

අපි අපගේ පවුල් සමාජිකයන්ට කමාව දිය යුතු බව සභාපති උක්ඩෝෆ් උගන්වයි. ජෝසෆ්ගේ සහ ඇනාගේ තේරීම් ඔවුන්ගේ පවුලට බලපෑවේ කෙසෙදැයි බලන්න.

ජෝසෆ් සහ ඔහුගේ කුඩා සොයුරිය ඇනා, සෙල්ලම් කරමින් සිටිති. ඇනා ජෝසෆ්ගේ සෙල්ලම් බඩුවක් ඔහුගෙන් උදුරාගනියි. ජෝසෆ් කුමක් කළ යුතුද?

**ජෝසෆ් ඇනා සමග අමනාපවෙයි.** ඇනා හඬයි. ජෝසෆ් සිය සොයුරිය හා දබරවීම ගැන ඔහුගේ මව ඔහුව හික්මවයි. ජෝසෆ් වැරදි තේරීමක් කිරීම ගැන කණගාටුවෙයි.

**ජෝසෆ් ඇනාට කමාවදී සෙල්ලම්කිරීමට තවත් සෙල්ලම්බඩුවක් සොයාගනියි.** ඔවුහු සතුටින් සෙල්ලම් කරති. ජෝසෆ් සිය සොහොයුරියට කරුණාවන්ත්වී පවුලේ සමාදානය තැබීම ගැන ඔවුන්ගේ මව සතුටුවෙයි. කමාවදීම තෝරාගැනීම ගැන ජෝසෆ් සතුටක් හැඟෙයි.

පසුව, රාත්‍රී අහාරය සූදානම්කිරීමට ජෝසෆ් සහ ඇනා සිය මවට උදව්කළ යුතුය. ජෝසෆ් උදව්රන්නේ නැත. ඇනා කුමක් කළ යුතුද?

**ඇනා සිය මවට පැමිණිලි කරයි.** තනියම වැඩකිරීමට සිදුවීම ගැන ඇනා වාදකරයි. රාත්‍රී කෑමවේලාවේදී වාදකිරීම නිසා හැම කෙනෙක්ම අසතු-ටෙන් සිටියි.

**ඇනා ජෝසෆ්ට කමාවදී රාත්‍රී කෑම සෑදීමට උදව්කරයි.** ඇනා උපකාරකිරීම ගැන ඔවුන්ගේ මව කෘතඥවෙයි. සියල්ලෝම රාත්‍රී කෑමට එකට සිටීම ගැන පවුල සතුටුවෙයි. කමාවදීම තෝරාගැනීම ගැන ඇනා සතුටුවෙයි.

ඔබ කමාවදීම තෝරාගැනීම ඔබගේ පවුලේ ප්‍රීතියට බලපාන්නේ කෙසේද?

© 2012 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6:11. පරිවර්තන අනුමැතිය: 6:11. *First Presidency Message, October 2012* පරිවර්තනයයි. Sinhala. 10370 408

ඇදහිල්ල, පවුල, සහනය

# අපගේ ගිවිසුම්වලට ගරුකිරීම

*මෙම ලිපිය යාච්ඤාවෙන් යුතුව කියවා, අදාළ පරිදි, ඔබ බැහැදකින සොයුරියන් හා එය බෙදාගන්න. ඔබගේ සොහොයුරියන් ශක්තිමත්කිරීමට අවශ්‍ය ප්‍රශ්න අසන්න, සහ සහන සමිතිය ඔබගේම ජීවිතයේ ක්‍රියාකාරී කොටසක් කරගන්න.*

බැහැදැක ඉගැන්වීම් අපගේ ගෝලකම ප්‍රකාශකිරීමක් මෙන්ම අපි එකිනෙකාට සේවයකරමින් ඔවුන් ශක්තිමත්කරන විට එය අපගේ ගිවිසුම්වලට ගරුකිරීමේ මාර්ගයක්ද වන්නේය. ගිවිසුමක් යනු දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ දරුවන් අතර ඇති පූජනීය සහ කල්පවතින පොරොන්දුවකි. "අපි ගිවිසුම තුල දරුවන් බව අපට අවබෝධවන විට, අප කවුරුද කියා සහ දෙවියන්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද කියාත් අපි දැනගන්නෙමු," යයි ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ වැඩිහිටි රසල් එම්. නෙල්සන් පැවසීය. "උන්වහන්සේගේ නීතිය අප හදවතේ ලියා ඇත. උන්වහන්සේ අපගේ දෙවියන්වහන්සේවන අතර, අපි උන්වහන්සේගේ ජනතාව වන්නෙමු."[1]

බැහැදැක උගන්වන ගුරුවරුන් වශයෙන් අප බැහැදකින අයට ඔවුන්ගේ පූජනීය ගිවිසුම් තැබීමට දරන උත්සාහයන් ශක්තිමත්කිරීමට අපට හැකිය. එසේ කිරීම මගින්, සදාකාලික ජීවනයේ ආශිර්වාද සඳහා අපි ඔවුන්ට උදව්කරන්නෙමු. "ස්වාමීන්වහන්සේ සමග ගිවිසුම් තැබූ මෙම සභාවේ සෑම සොහොයුරියකටම ආත්ම ගලවාගැනීමට, ලෝකයේ කාන්තාවන් මෙහෙයවීමට, සයෝනයේ නිවාස ශක්තිමත්කිරීමට, සහ දේවරාජ්‍යය ගොඩනැගීමට නිල නියෝගයක් ඇත,"[2] යයි ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ වැඩිහිටි එම්.රසල් බලාඩ් කීවේය.

අපි පූජනීය ගිවිසුම් තබා ඒවා ආරක්ෂාකරන විට, අප දේව හස්තයේ මෙවලම් බවට පත්වන්නෙමු. අපගේ විශ්වාසය ප්‍රකාශකිරීමට සහ ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි එකි නෙකා තුල ඇති ඇදහිල්ල ශක්තිමත්කිරීමටද අපට හැකිවන්නේය.

## *ශුද්ධ ලියවිලිවලින්*

1 නෙපී 14:14; මොසායා 5:5–7; 18:8–13; දහම සහ ගිවිසුම 42:78; 84:106

## *අපගේ ඉතිහාසයෙන්*

දේවමාළිගා "සියලුම ශුද්ධවන්තයන්ට ප්‍රශංසාකිරීමේ ස්ථානයකි," යයි ස්වාමීන්වහන්සේ 1833දී අනාගතවක්තෘ ජෝසප් ස්මිත්ට එළිදරව්කළසේක. එය "පූජක ධූරයේ වැඩකිරීම සඳහා කැඳවනු ලැබූ සියල්ලන්ටම ඔවුන්ගේ විවිධ කැඳවීම් සහ නිළයන්වලට උපදෙස් දෙන ස්ථානයකි; පොළොව මත දේවරාජ්‍යය සම්බන්ධ ඔවුන්ගේ ධූරයේ, න්‍යායයන්, මූලධර්ම, සහ ධර්මය අවබෝධකරගෙන ඔවුන් අංගසම්පූර්ණවනු ඇත." (බලන්න ඩීසහසී 97:13–14).

සහන සමිති සොහොයුරියෝ 1840 මුල් භාගයේදී ඉලිනොයිස්, නාවූ නගරයේදී දේවමාළිගා නියෝග ලබාගැනීම සඳහා සූදානම්වීමට එකිනෙකාට උදව්කළහ. නාවූ දේවමාළිගාව තුලදී පසු-දවස්වල ශුද්ධවන්තයන් ලබාගත් උසස් පූජකවරයේ නියෝග තුලින් "දේවත්වයේ බලය ප්‍රකාශ [විය]" (බලන්න ඩීසහසී 84:20). "ශුද්ධවන්තයන් ඔවුන්ගේ ගිවිසුම් තැබූ විට, මෙම බලය ඔවුන්ගේ පරීක්ෂාවන්වලදී සහ ඉදිරිකාලයේ දවස් සහ වසරවලදී ඔවුන්ව ශක්තිමත්කර පෝෂණය කළේය."[3]

වර්තමානයේ සභාව තුල, මුළු ලෝකයේම ඇදහිලිමත් කාන්තාවෝ සහ මිනිස්සු දේවමාළිගාවල සේවයකරමින්, දේවමාළිගා ගිවිසුම් තුලින් පමනක් ලබාගතහැකි ආශිර්වාදවල ශක්තිය නොකඩවා ලබති.

සටහන්

1. රසල් එම් නෙල්සන්, "Covenants," *Liahona*, නොවැ. 2011, 88.
2. එම් රසල් බලාඩ්, "Women of Righteousness," *Liahona*, දෙසැ. 2002, 39.
3. *Daughters in My Kingdom: The History and Work of Relief Society* (2011), 133.

## *මට කුමක් කළ හැකිද?*

1. මගේ ගිවිසුම් මා ශක්තිමත්කරන්නේ කෙසේද?

2. මා සොයාබලන සොහොයුරියනට ඔවුන්ට ගිවිසුම් තැබීමට මා උපකාරකරන්නේ කෙසේද?

වැඩිදුර තොරතුරු සඳහා යන්න, reliefsociety.lds.org.

© 2012 Intellectual Reserve, Inc.((=65=))විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6:11. පරිවර්තන අනුමැතිය: 6:11. *Visiting Teaching Message, October 2012* පරිවර්තනයයි. Sinhala. 10370 408